චක්‍රලේඛ අංක : 02 / 2010 (1)

සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත
අංක 121 / 3 , කිරුළපන මාවත,
කොළඹ 05
2010. 10. ..21.... දින

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිතිවල
සභාපතිවරුන් වෙත.

## සමුපකාර සේවක වැටුප් ප්‍රතිශෝධනය - 2010

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සේවකයින්ගේ වැටුප් ක්‍රම සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2 / 2010 චක්‍රලේඛයට අදාළව එක් එක් සමුපකාර සමිති කරනු ලැබූ විවිධ විමසීම් හා ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පරිදි අදාළ ඡේද සඳහා සංශෝධන එකතු කරනු ලැබේ.

<u>ඡේද අංකය</u>

1. "බස්නාහිර පළාත් සමුපකාර සමිති වල " යන්න වෙනුවට "බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති හා සමුපකාර සමිති සංගම් " යන්න ලෙස සංශෝධනය විය යුතු වේ.

12. 2 සේවය ස්ථිර කිරීමට "101 හා 102 වැටුප් පරිමාණ වල තනතුරු සඳහා " යන්න වෙනුවට " 103 හා 104 වැටුප් පරිමාණයේ තනතුරු සඳහා " ලෙස සංශෝධනය විය යුතුය.

21. මෙම ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු වේ.

21. 1 සංග්‍රහ දීමනා

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | - රු. 450.00 |
| කළමනාකරණ මට්ටම | - රු. 400.00 |
| විධායක හා මෙහෙයුම් මට්ටම | - රු. 350.00 |
| කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | - රු. 300.00 |

සංයුක්ත දීමනා ගණන් බැලීමේ දී පැය 12 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා සම්පූර්ණ දීමනාව ද , පැය 06 ක් හෝ ඊට වැඩි පැය 12 දක්වා කාලය සඳහා දීමනාවෙන් අඩකට ද හිමිකම් ලබයි.

21. 2 <u>අභ්‍යන්තර දීමනා</u>

ඌණ සේවා නියුක්ත උපාධිධාරීන් සඳහා මෙතෙක් ගෙවනු ලද රු. 2500/= ක දීමනාව පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි.

i) 2004 උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවා ගන්නා ලද උපාධිධාරීන් තවදුරටත් යම් සමිතියක සේවයේ යෙදී ඇත්නම් ඔහු විශ්‍රාම යන / සේවයෙන් ඉවත්වන දිනය දක්වා ඔහුට පුද්ගලික වන සේ මෙම දීමනාව ලබාගත හැකිය.

ii) යම් තනතුරක අනුමත බඳවා ගැනීම් පරිපාටිය යටතේ උපාධිය සුදුසුකමක් හැටියට සඳහන් වන්නේ නම් ද , එම සුදුසුකම සැලකිල්ලට ගෙන බඳවා ගෙන ඇති සමුපකාර සමිති නිලධාරියෙකුට උපාධිධාරී දීමනාව ලබා ගැනීමට හිමිකමක් නැත. (උදා :- සාමාන්‍යාධිකාරී , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී , වැනි තනතුරු හෝ ඊට සමාන වෙනත් තනතුරු නාමයක් සහිත තනතුරු)

iii) ඊට අමතරව තවදුරටත් යම් සමුපකාර සමිති සේවකයෙකු මෙම දීමනාව ලබා ගන්නේ නම් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර නැවත අනුමැතිය ලබා ගත යුතුය.

iv) සමුපකාර සමිති , ස. ණ. ස. සමිති හා බැංකු සංගම් විසින් තම සමිති වල ආර්ථික ශක්තිය මත ආහාර දීමනා , ප්‍රවාහන දීමනා වැනි විවිධ ආකාර දීමනා තම සේවකයින් වෙත ලබා දෙන අවස්ථා අනාවරණය වී ඇත. 02 / 2010 චක්‍රලේඛය සකස් කිරීමේ දී සැලකිල්ලට ගන්නා ලද්දේ

- 4 / 2001 චක්‍රලේඛය ( රු. 1000/= )
- 4 / 2004 චක්‍රලේඛය ( රු. 1250/=)
- බ.ප./ ස.සේ.කො./ ලේ.නිර් - 2005. 10. 05. ලිපිය ( රු. 1000/= )
- 6 / 2006 චක්‍රලේඛය ( රු. 1500/= )

යන චක්‍රලේඛ මත ලබාදෙන රු. 4750/= ක දීමනාව පමණකි. අනෙකුත් දීමනා තවදුරටත් තම සමිති සේවකයින්ට ලබා දීමට යම් සමිතියක් අදහස් කරන්නේ නම් , ස.සං.කො / රෙ. ගේ නිර්දේශය සහිත ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නැවත අනුමැතිය ලබා ගත යුතුය.

## <u>දැනට පවතින තනතුරු වර්ගීකරණ නාමාවලියේ සංශෝධන</u>

### <u>කළමනාකරණ මට්ටම</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක | 12 ගණකාධිකාරී | III | 102 : 05 | II | 102 : 04 | I | 101 : 03 |

(දැනට 102 : 06 වශයෙන් කර ඇති වර්ගීකරණය ඉවත් කරනු ලැබේ.)

## <u>තනතුරු වර්ගීකරණ නාමාවලියට නව එකතු කිරීම්</u>

### කළමනාකරණ මට්ටම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක : | 92 කළමනාකරු (ප්‍රවාහන) | III | 102 : 06 | II | 102 : 05 | I | 102 : 04 |
| | 93 කළමනාකරු (මුද්‍රණාල) | III | 102 : 06 | II | 102 : 05 | I | 102 : 04 |

### <u>අධීක්ෂණ මට්ටම</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක : | 94 සහකාර කළමනාකරු (වාණිජ) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 95 සහකාර කළමනාකරු (නිෂ්පාදන) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 96 සහකාර කළමනාකරු (ව්‍යාපෘති) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 97 සහකාර කළමනාකරු (බැංකු සේවා) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 98 කාර්යාල සහකාර | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 99 වෙළඳසැල් පරිපාලක | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 100 සෞඛ්‍ය නිලධාරී | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 101 වැඩ මූලික (යන්ත්‍ර) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 102 වැඩ මූලික (පොත් බැඳීම් ) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |
| | 103 වැඩ මූලික (වර්ණයෝජක) | III | 103 : 07 | II | 102 : 06 | I | 102 : 05 |

### <u>[illegible]යාම් මට්ටම</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක : | 104 තොග ගබඩා භාරකරු | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 105 මෝටර් රථ කාර්මික | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 106 වඩු කාර්මික | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 107 පෙදරේරු | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 108 විදුලි කාර්මික | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 109 වර්ණයෝජක | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| | 110 පෙට්ටි සාදන්නා | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 111 පොලිෂ් කරන්නා | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| 112 මල්කරු | III | 104 : 08 | II | 103 : 07 | I | 102 : 06 |
| 113 ප්‍රචාරක නිලධාරී | III | 104 : 09 | II | 104 : 08 | I | 103 : 07 |
| 114කළමනාකරණ සහකාර -විගණන | III | 104 : 09 | II | 104 : 08 | I | 103 : 07 |
| 115 කළමනාකරණ සහකාර -පරිගණක | III | 104 : 09 | II | 104 : 08 | I | 103 : 07 |
| 116 සහාය ඖෂධවේදී | III | 104 : 09 | II | 104 : 08 | I | 103 : 07 |

**කනිෂ්ඨ කාර්ය මණ්ඩලය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංක : | 117 සහාය මෝටර් කාර්මික | III | 105 : 10 | II | 104 : 09 | I | 104 : 08 |
| | 118 පින්තාරුකරු | III | 105 : 10 | II | 104 : 09 | I | 104 : 08 |

**වෙනස් කරුණු**

| පැවති තනතුරු නාමය | නව තනතුරු නාමය |
|---|---|
| 1. පරිගණක ලිපිකරු | කළමනාකරණ සහකාර -පරිගණක |
| 2. විගණන ලිපිකරු | කළමනාකරණ සහකාර -විගණන |

අයි. ආර්. සෝමසිරි,

ලේකම්

සමුපකාර සේවක කොමිෂන් සභාව

බස්නාහිර පළාත

පිටපත් :-

1. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්,
3. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය
4. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ / කළුතර / ගම්පහ)
6. ලේකම් , සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තිය සමිති සංගම්